# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

ඩී. ජී. කේ. දිල්රුක්ෂි
අංක 330/3 ,
ගාලු පාර ,
ගල්කිස්ස

<u>අභියාචක</u>

**අභියාචනා අංකය : 719/2021**

එදිරිව

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
රත්මලාන

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න - සභාපති
2. විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් නිමාලි කරුණාරත්න මිය (නම් කළ නිලධාරි) පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - 2022.02.21

**විභාග කළ දිනය** : 2022.03.02

**තීරණය කළ දිනය** : 2022.03.02

## <u>තීරණය</u>

### අභියාචනයට පසුබිම් වූ කරුණු

අභියාචක විසින් 2021.04.20 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*“ ...වරිපනම් අංක 330/3 ගාලු පාර ගල්කිස්ස හි පදිංචි D.G.K. දිල්රුක්ෂි වන මාහට 2016 අංක 12 දරණ තොරතුරු පනතට අදාලව පහත සඳහන් ලිපි මා හට නීත්‍යානුකූලව සහතික කර ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.*

1. *ඔබ තුමිය විසින් සඳහන් කර ඇති කැඩස්තර සිතියම් අංක 521004 කලාප අංක 10,3 වැනි කලාපයෙහි ඉඩම් කොටස් අංක 130හි බස්නාහිර - දකුණ සිට උතුරු දෙසට මීටර් 2.4ක් (330/3 හි A2 යන මාගේ පුද්ගලික බිම් කොටස තුලට) මාර්ගයට අයත් බවට රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඔබ තුමිය හට ලබා දී ඇති ලිපිය.*

*<u>සැලකිය යුතු කරුණු</u>*
*රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් ලිපිය ඔබ වෙත ලබා දී ඇති බව මා හට සහකාර ප්‍රාදේශීය ලේකම් තුමිය ප්‍රියානි ප්‍රනාන්දු මහත්මිය විසින් 05/04/2021 දින හා 08/04/2021 දින අප හට වගකීමෙන් දැනුම් දී සිටියේය.*

2. *කැඩස්තර සිතියම් අංක 521004 කලාප අංක 10,3 වැනි කලාපයෙහි ඉඩම් කොටස් අංක 131හි නැගෙනහිර - දකුණ සිට උතුරු දෙසට මීටර් 2.4ක 330/2 ගාලු පාර ගල්කිස්ස යන විරෝධ කරුහට 330/3 හි A2 යන මාගේ පුද්ගලික බිම් කොටස තුලින් (බස්නාහිර දිසාවෙන්) තෙවැනි පිවිසුම් ගේට්ටුව සවිකිරීමට අනුමත වී ඇති බව පැවසු නීත්‍යානුකූල ලිපි හා සිතියම*

*<u>සැලකිය යුතු කරුණු</u>*
*19/04/2021 දින ගරු දිස්ත්‍රික් ලේකම් තුමා වන ප්‍රදීප් යසරත්න මහත්මා හට අප විසින් දැන්වූ අවස්ථාවෙදී එතුමා විසින් අප ඉදිරිපිටම දුරකථනයෙන් ඔබ තුමියගෙන් (ප්‍රාදේශීය ලේකම් තුමිය) කරුණු විමසූ විට ඉහත සඳහන් ගේට්ටුව අනුමත වී ඇති බව හා අදාළ ලිපි ඔබතුමිය සතුව ඇති බව දිස්ත්‍රික් ලේකම් තුමා අප හට වගකීමෙන් දැනුම් දී සිටියේය.”*

ඒ අනුව, තොරතුරු නිළධාරි 2021.05.19 දිනැතිව පිළිතුරු සපයමින් පවසා ඇත්තේ,

*“...ඔබ විසින් 2021.04.22 දින ඉදිරිපත් කරන ලද ලියාපදිංචි අංක RTI/2021/02 දරණ තොරතුරු පහත සඳහන් හේතු මත ප්‍රතික්ෂේප කරන ලද බව දන්වමි.*

i. *කැඩස්තර සිතියම් අංක 521004 කලාප අංක 10,3 වැනි කලාපයෙහි ඉඩම් කැබලි අංක 130 හි බස්නාහිර - දකුණ සිට උතුරු දෙසට මීටර් 2.4ක් පවතින බව දන්වා ඇති ලිපියේ පිටපතක් - මෙම තොරතුරු දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත ලිඛිත ඉල්ලීමක් කර ලබා ගැනීමට හැකියාව ඇති බව තෙවන පාර්ශවය විසින් දන්වා ඇත.*
ii. *කැඩස්තර සිතියම් අංක 521004 කලාප අංක 10,3 වැනි කලාපයෙහි ඉඩම් කොටස් අංක 131හි නැගෙනහිර - දකුණ සිට උතුරු දෙසට මීටර් 2.4ක 330/2 ගාලු පාර ගල්කිස්ස යන විරෝධ කරුහට 330/3 හි A2 යන මාගේ පුද්ගලික බිම් කොටස තුලින් (බස්නාහිර දිසාවෙන්) තෙවැනි පිවිසුම් ගේට්ටුව සවිකිරීමට අනුමත වී ඇති බව පැවසු නීත්‍යානුකූල ලිපි හා සිතියම - මෙම තොරතුරු වෙනත් පාර්ශවයකට ලබා දීම සම්බන්ධයෙන් තෙවන පාර්ශවය විසින් විරෝධය පල කර ඇත...”* යනුවෙනි.

එම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2021.06.29 දිනැතිව නම්කළ නිලධාරී වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිළධාරි 2021.07.26 දිනැතිව පිළිතුරු සපයමින් පවසා ඇත්තේ,

*"...මෙම තොරතුරු වෙනත් පාර්ශවයකට ලබා දීම සම්බන්ධයෙන් තෙවන පාර්ශවය විසින් විරෝධය පල කර ඇත." යනුවෙනි.*

එකී ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2021.08.03 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

තවද, පොදු අධිකාරිය විසින් 2021.02.24 දිනැතිව කොමිෂන් සභාව වෙත එවා ඇති ලිපිය මඟින් පහත පරිදි කරුණු දක්වා ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

*"...*

*03. ...ඉහත තොරතුරු ලබා දීම පිළිබඳව අදාළ තෙවන පාර්ශවයන්ගෙන් විමසීම් කරන ලදී. ඉහත අනු අංක i මඟින් ඉල්ලූ තොරතුර තම ආංශික දත්ත ඇසුරෙන් ලබා දී ඇති තොරතුරක් වීම හේතුවෙන් එම තොරතුර වෙනත් පාර්ශවයකට ලබා දීම සම්බන්ධයෙන් කැස්බෑව මිනින්දෝරු කාර්යාලය විසින් විරෝධය දක්වන ලද අතර (ඇමුණුම් අංක 05) අනු අංක ii මඟින් ඉල්ලා ඇති තොරතුරු තම පුද්ගලික තොරතුරු වන හෙයින් වෙනත් පාර්ශවයකට ලබා නොදෙන ලෙස 330/02 ගාලු පාර ගල්කිස්ස යන ලිපිනයේ පදිංචි අග්‍රා මීමනගේ යන අය විසින් විරෝධය දක්වා ඇත. (ඇමුණුම අංක 06)*

*04. ඉහත කරුණු සළකා බැලීමෙන් අනතුරුව අදාළ තොරතුරු ලබාදීම තොරතුරු නිළධාරී විසින් හා අනතුරුව සිදුකරන ලද අභියාචනය (ඇමුණුම අංක 07) මවිසින් ප්‍රතික්ෂේප කරන ලද බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි."*

සළකා බැලීම

ඉදිරිපත් වී ඇති කරුණු කොමිෂන් සභාව විසින් ඉතා සුපරික්ෂාකාරීව සළකා බලන ලදී. අභියාචක විසන් ඉල්ලා සිටි ඉහත සඳහන් කරන ලද තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට අදාළව නෛතික විධිවිධාන නම් කළ නිලධාරි විසින් තම තීරණයට අන්තර්ගත කර නොමැත. නම් කළ නිලධාරි විසින් මෙම කොමිෂන් සභාව වෙත එවන ලද 2020.02.04 දිනැති ලිපියෙහිවත් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට අදාළ වූ නෛතික විධිවිධාන දක්වා නොමැත.

අද දින මෙම විමර්ශනයේදීද තම ස්ථාවරය තහවුරු කිරීමට නම් කළ නිලධාරිට නොහැකි විය. ඉහත සඳහන් තොරතුරු ඉල්ලීම පනතේ 5 වන වගන්තියේ සීමාවන් තුලට ගැනෙන බවට කොමිෂන් සභාවට නිරීක්ෂණය නොවේ. එබැවින් එකී කරුණු සළකා බලා නම් කළ නිලධාරි විසින් එළඹ ඇති තීරණය ප්‍රතික්ෂේප කරමින් අභියාචක විසින් 2021.04.20 දිනෙන් සිදු කර ඇති තොරතුරු ඉල්ලීමෙහි දක්වා ඇති සියලු තොරතුරු 2022.03.31 දින හෝ ඊට ප්‍රථම, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය සහ තොරතුරු නිලධාරි ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට  කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.